---

**අක්මීමණ ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජූනි 04 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 12 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති අක්මීමණ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගෙන තිබුණු වටිනාකම රු.1,385,000 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ රු.2,904,036 ක් වූ ලී බඩු හා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් ලෙස නොදක්වා පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගෙන තිබුණු වටිනාකම රු.20,114,786 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් ලෙස නොදක්වා පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම බිල්කිරීම මූල්‍ය ප්‍රකාශනවල රු.500,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.500,000 ක උසාවි දඩ ලැබීම් මුද්දර ගාස්තු ලැබීමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභික දීමනාව රු.908,000 ක් වුවද, රු.531,250 ක් වූ ණය අඩුකිරීමෙන් පසු ශුද්ධ ගෙවීම වූ රු.376,750 ක මුදල පමණක් 1-101-9 වැය විෂයයට හර කිරීම හේතුවෙන් සභික දීමනා රු.531,250 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීමට තිබුණු දායක මුදල් ශේෂය රු.2,813,479 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.66,468 ක් ලෙස දක්වා තිබීමෙන් ගෙවිය යුතු ශේෂය රු.2,747,011 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 12 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.4,183,653 ක් විය.

#### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.67,175,734 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,825,908 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,473,016 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 2,396 | 5,364 | 1,956 |
| (ii) | බදු කුලී | 1,710 | 1,595 | 436 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 867 | 808 | 258 |
| (iv) | සේවා සඳහා ගාස්තු | 4,687 | 4,816 | - |
| (v) | වෙනත් ආදායම් | 26,928 | 11,738 | 31,621 |

### 2.2.2 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතු රු.1,666,027 ක් වූ වරිපනම් බදු, රු.289,766 ක් වූ අක්කර බදු සහ රු.436,102 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,142,261 |
| (ii) | මුද්දර ගාස්තු | 18,083,595 |

## 2.2.4 බැංකු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 අගෝස්තු බැංකු සැසඳුම ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ රු.1,030,188 ක චෙක්පත් 203 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඩී) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) රු.2,976,475 ක් වූ සෘජු බැර කිරීම් හා රු.31,317 ක බැංකු හර කිරීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.5,429 ක් වටිනා උපලබ්ධි නොවූ චෙක්පත් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

## 2.3 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### (අ) සැලසුම් කමිටු දීමනා ගෙවීම

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: 05/01/119/වෙIX හා 1992 පෙබරවාරි 26 දිනැති චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව සැලසුම් කමිටු දීමනා ගෙවීමට පෙර පළාත් පාලන ආයතනයේ සභා සම්මුතිය අදාළ පළාත් පාලන කොමසාරිස් විසින් අනුමත කළයුතු වුවත්, 2012 වර්ෂයට අදාළව රු.146,800 ක් කමිටු දීමනා ගෙවීම් කිරීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.
කමිටු දීමනා ගෙවීමේ දී රැස්වීම් සඳහා සහභාගී වී නොතිබුණු නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් 2012 වර්ෂය තුළ දී රු.24,000 ක මුදලක් ගෙවා තිබුණි.

### (ආ) ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සව වියදම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක්දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගත යුතුය. කෙසේ වුවද, සභාව

---

විසින් එසේ අනුමැතිය නොලබා සභාවේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් 2012 අගෝස්තු 20, 21 හා 22 දින යන දිනයන්හි රු.615,065 වියදමක් දරා තිබුණි.

**(ඇ) ආදේශක සේවකයින් බඳවා ගැනීම හා වැටුප් ගෙවීම**

2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ස්ථිර/තාවකාලික/ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගැනීම් කරනු ලබන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු බව දක්වා තිබුණ ද, එලෙස අනුමැතිය ලබා නොගෙන සභාව විසින් ආදේශක සේවකයින් 49 දෙනෙකු බඳවා ගෙන 2012 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.6,110,684 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**(ඈ) විදුලි කණු මිලදී ගැනීම්**

(i) 2012 සැප්තැම්බර් 25 දින රු.1,085,359 ක් ගෙවා විදුලි කණු 06 ක් මිලදී ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 විධිවිධාන අනුව මිලියන 01 ත් 05 ත් අතර මිළදී ගැනීම් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර නොතිබු අතර විදුලි කණු සිටුවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණි. නව නගර නිර්මාණ සැලැස්මක් ද සකස් කර නොතිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභිකයින් 08 දෙනෙකු විසින් විගණන දින වූ 2013 ඔක්තෝබර් 06 දින දක්වාම වත්කම් හා බැරකම් ප්‍රකාශ සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වර්ෂ 13 කට වැඩි කාලයක සිට අය නොවී පැවති රු.140,556 ක සේවක ණය ශේෂයක් වූ අතර, ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බලප්‍රදේශයේ වීථි පහන් අළුත්වැඩියා හා නඩත්තු සඳහා 2012 වර්ෂයේ රු.1,393,620 ක විදුලි භාණ්ඩ නිකුත් කර ඇතත්, 2012 වර්ෂය වෙනුවෙන් විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණේ රු.77,238 ක් පමණි.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 දෙසැම්බර් 16 දිනැති අංක: 05/02/1/384 චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සෑම ඉදිකිරීමක් වෙනුවෙන්ම අනුකූලතා සහතිකයක් ද ලබා ගතයුතු වුවද, සභාව විසින් ගෘහ හා ව්‍යාපාරික ස්ථාන ඉදිකිරීම වෙනුවෙන් අනුකූලතා සහතික ලබා දී තිබුණේ ඉතා සුළු ප්‍රමාණයක් පමණක් විය.

(ඉ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(ඊ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.5 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය